# 3 ශ්‍රේණිය සිංහල 2022

# ගුරු අත් පොතට වැඩ පොත අංක 09

## L5, S5, R5, W5 නිපුණතා ආවරණය



- කතන්දර කියවා අන්තර්ගතය ප්‍රකාශ කරයි.
- කතන්දර කියවා තර්කානුකූල ව අදහස් ඉදිරිපත් කරයි.
- වාංමාලා පෝෂණය සඳහා වචන එක් රැස් කරයි.
- යුගල පද සහ ප්‍රස්තාව පිරුළු නිවැරදි ව භාවිත කරයි.

**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

## <u>යුගල පද</u>

- යුගල පද යනු - වචන දෙකකි.
- යුගල පදවල විශේෂත්වය වන්නේ එකවර වචන දෙකක් ම යෙදීමයි.
- මෙම යුගල පද යෙදීම නිසා කතා කරන දේ ලියන දේ අලංකාර වෙයි.
- යුගල පද ලිවීමේ දී පද වෙන් කර ලිවිය යුතුයි.
- හොඳ දරුවෝ ඡේදයේ පහත සඳහන් යුගල පද වර්ණ ගන්වන්න.

### <u>හොඳ දරුවෝ</u>

අෑත කඳුකර ප්‍රදේශයක තිබුණු සුන්දර ගමක පුංචි පවුලක් ජීවත්වුණා. අම්මා, තාත්තා, දුව සහ පුතා මේ පවුලේ සාමාජිකයෝ. පුතාගේ නම මලිත්. දුව මලිති. මලිත් සහ මලිති ඉතා ම හොඳ ගති පැවතුම් ඇති ළමයි දෙදෙනෙක්. අම්මා සමඟ ගමන් බිමන් යන්න මේ දෙන්නා හරි ම ආසයි. ඒ යන අතරමඟ දී හමුවන අහල පහල අය සමඟ මොවුන් සුහද ව කතා බහ කරනවා. ගමේ හැම දෙනා ම මේ දරුවන් දෙන්නාට හරි ම ආදරෙයි. අපේ සිරිත් විරිත්වලට ගරු කරන, දෙමවුපියන්ට කීකරු වී හැදෙන ළමයි දෙදෙනෙක් කියලා ගමේ කවුරුත් කතා බහ කළා. මේ දරුවන්ගේ හොඳ ගතිගුණවලට පැහැදුණු ගමේ සමහර අය ඔවුන්ට තෑගි බෝග පවා රැගෙන ගෙදරට අවා. එසේ පැමිණෙන අයට කෑම බීමවලින් සංග්‍රහ කරන්න මේ ගෙදර අය අමතක කළේ නැහැ. මේ දරුවෝ දෙන්නා ඉගෙනීමටත් දක්ෂ යි. පාසලේ බාහිර වැඩ කටයුතුවල දී ද මොවුන් කැපී පෙනෙන අයුරින් කටයුතු කරනවා.

- වරහනින් තෝරා සුදුසු පද යොදා හිස්තැන් පුරවන්න. (බිමන්, බෝග, බීම, පහල, විරිත්)

ගමන් - ....................................  අහල - ....................................

සිරිත් - ....................................  තෑගි - ....................................

කෑම - ....................................

- 'හොඳ දරුවෝ' කතන්දරයේ යුගල පද යෙදී ඇති නිසා එම වාක්‍ය අලංකාර වී ඇති බව උදාහරණයකින් ගෙන දක්වන්න.

උදා : 1. අම්මා සමඟ <u>ගමන්</u> යන්න මේ දෙන්නා හරි ම ආසයි.
2. අම්මා සමඟ <u>ගමන් බිමන්</u> යන්න මේ දෙන්නා හරි ම ආසයි.

......................................................................................................................................

......................................................................................................................................

- උගත් යුගල පද යොදා වාක්‍ය තනන්න.

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

## <u>ප්‍රස්තාව පිරුළු</u>

- කියවීම් පොතේ ඇතුළත් රජතුමාගේ ඔටුන්න පාඩම ආදර්ශ කියවීමක යෙදෙන්න. උගත් ප්‍රස්තාව පිරුළු වල හිස්තැන් සම්පූර්ණ කරන්න.

ගෙදර ගිය යහළුවන් සවස ආයෙත් පාසලට ආවා. ඒ, වාර අවසානයේ විවිධ ප්‍රසංගයට නාට්‍ය පුහුණු වෙන්න.

''විවිධ ප්‍රසංගයෙන් පස්සේ නිවාඩු කාලේ.
''අපේ තාත්තා කිවුවා මේ ගමන කැලෑවක ඇවිදින්න යමු යි කියලා. මම කවදාවත් කැළෑවකට ගිහින් නැහැ. මම හරි ආසාවෙන් බලන් ඉන්නේ ඒ දවස එනකම්.'' පියුම් කිවුවා.

''අපි නම් ගමේ යනවා.'' රුවින්දි කිවුවා.

''ගමේ යන එකත් හොඳයි. ඒත් ඉතිං රටේතොටේත් ටිකක් ඇවිදින්න ඕනෑ. නැත්නම් ඉතින් **ළිඳේ ඉන්න ගෙම්බා වගේ** තමයි. ගුරුතුමා ද කතාවට එකතු වුණා.

රජතුමාට රඟපාන පසිඳු තව ම ඇවිත් නැහැ. යහළුවන් කසු කුසු ගෑවා.

''ළමයි දැන් අපි නාට්‍යය පුහුණු වෙන්න පටන් ගනිමු.'' ගුරුතුමා කිවුවා.

''එතකොට රජතුමා . . .'' පියුම් ඇසුවා.

''පසිඳු එනකම් මම රජ වෙන්නම්.'' මනුක එක අතක් ඉණට ගසා අනෙක් අත ඉහළට ඔසවා තාල තබා වටයක් කැරකුණා.

යහළුවන් සිනාසුණා.

''ඇයි හිනාවෙන්නේ මට රජවෙන්න බැරි ද ?'' පසිඳු ආවා ම මම රජකම භාර දෙනවා. මනුක කිවුවේ දෑත් දිගු කොට හිස නමමින්. යහළුවන් හොඳට ම සිනාසුණා.

''සිතුම් . . . එන්න ඉස්සරහට. ඔයාගේ කොටස රඟපාන්න.'' ගුරුතුමා කිවුවා.

''පස්වාන් දහසකට බුදු වෙන්න දේවයන් වහන්ස, මා ඔබ වහන්සේ ඉදිරියේ මුසා බස් දොඩනවා නොවෙයි. ඒ මිනිහා **මඩේ හිටවපු ඉන්න වගෙයි**.

අඳේට කුඹුර දෙන්නම් කිවුවා මුලින් ම. ඒත් දැන් කෙළින් වචනයක් දෙන්නේ නැහැ.

සලකා බලන්නම් . . . සලකා බලන්නම් . . . හැම දා ම සලකා බලන්නම්.''

''අන්න හරි, අද සිතුම් හොඳට රඟපෑවා. ඒ වගේ ම එදාටත් රඟපාන්න ඕනෑ. ගුරුතුමා සිතුම්ගේ හිස අත ගෑවා.

ඔය එන්නේ පසිඳුයි තරිඳුයි හරියට **ඉඳිකටුව යි නූලයි වගේ.** සිතුම් කිවුවේ පසිඳුයි තරිඳුයි නැටුම් කාමරයට ඇතුළු වෙන කොට ම යි.

''පසිඳු කොතැන ද තරිඳුත් එතැන. තරිඳු කොතැන ද පසිඳුත් එතැන. නාට්‍යයට නැති වුණත් තරිඳු ආවේ පසිඳු ඉන්න නිසා.'' සිතුම් කියාගෙන කියාගෙන ගියා.

''වෙලාවට වැඩ කරන්න පුරුදු වෙන්න ඕනෑ.'' ගුරුතුමා පසිඳුගේ පිටට තට්ටුවක් දැම්මා.

''නෑ සර් . . . තරිඳුගේ මාමාගේ පුතා ළඟ ඔටුන්නක් තියෙනවා කිවුවා. අපි ඒක බලන්න ගියා.''

''ඉතින් මෙච්චර පරක්කු වුණේ ඇයි ?''

''තරිඳු මාව මාමාලාගේ ගෙදරට එක්ක ගියේ **පරංගියා කෝට්ටේ ගියා වගේ** පාරකින්. මේ පාරෙන් ලෙහෙසියි කියකියා මාව ලොකු වටයක් එක්ක ගියා. එනකොට ආවේ කෙටි පාරකින්.''

''කෝ ඉතිං ඔච්චර දුර ගිහින් ගෙනා ඔටුන්න ?'' මනුක ඇහුවේ ඔටුන්නක් පෙනෙන්න නොතිබුණු නිසා.

''අම්මො '' . . . මෙයාගේ මල්ලිගෙන් ඒ ඔටුන්න ඉල්ල ගන්න එක හරි අමාරුයි. ඒක **ඉබ්බන්ගෙන් පිහාටු ඉල්ලනවා වගේ** වැඩක්. හැබැයි තරිඳුගේ මාමා මට ඔටුන්නක් හදලා දෙන්න පොරොන්දු වුණා.'' පසිඳු කිවුවා.

''හරි. දැන් ඔටුන්නත් හරි. රජ්ජුරුවොත් හරි. අපි නාට්‍යය පුහුණු වෙමු.''

''මෙන්න, රජතුමනි රජකම භාර ගන්න'' කියමින් මනුක පසිඳු ඉදිරියේ දණ නමා දෑත් දිගු කළා. යාළුවන් ඔක්කෝම එක හඬින් සිනාසුණා. නාට්‍ය පුහුණු වීමට පටන් ගත්තා.

01. පරංගියා ................................ ගියා වගේ.

02. ඉබ්බාගෙන් ................................ ඉල්ලනවා වගේ.

03. ඉදිකටුවයි ................................ වගේ.

04. ළිඳේ ඉන්න ................................ වගේ.

05. මඩේ හිටවපු ................................ වගේ.


- සුදුසු ප්‍රස්තාව පිරුළ තෝරා යා කරන්න.

| | |
|---|---|
| ළිඳේ ඉන්න ගෙම්බා වගේ | කිට්ටු පාරක් තිබිය දී දුර පාරකින් යෑම |
| ඉදිකටුවයි නූලයි වගේ | එක තීරණයක නොසිටීම |
| මඩේ හිටවපු ඉන්න වගේ | කෙනෙකුගෙන් කෙසේ වත් ලබාගත නොහැකි දෙයක් ලබා ගැනීමට උත්සාහ දැරීම |
| ඉබ්බාගෙන් පිහාටු ඉල්ලනව වගේ | සැමවිටම තමන් සමග තවත් අයෙක් එකට සිටීම |
| පරංගියා කෝට්ටේ ගියා වගේ | තමා අවට සමාජය පිළිබඳ අවබෝධයක් නොමැති ව සිටීම |

<u>**පුනරීක්ෂණ**</u>

**හා හා හරි හාවා - කැලේ මැදින් ආවා**
**සිටගෙන ගඟ ගාවා - වට පිට ඇහැලෑවා**
**කොළ දෙකටක් කෑවා - පැන් උගුරක් බීවා**
**තොලකට ලෙව කෑවා - ඉතින් ඇතැයි කීවා**

(කුමාරතුංග මුනිදාස ශූරින්)



(1) හාවා ආවේ කොහේ සිටද? ..............................................................................

(2) කවියේ සඳහන් වන අයුරින් හාවා විසින් කරනු ලබන කාර්යයන් දෙකක් ලියන්න.

..............................................................................................................

..............................................................................................................

(3) කවි පෙළෙහි සඳහන් පහත සඳහන් දේ සොයා ලියන්න.

- සමානාර්ථ පද

1. වනයේ - .......................................... යුගල පදයක් - ..........................................

2. නදිය - .......................................... ක්‍රියා පදයක් - ..........................................

3. ජලය - ..........................................

(4) පහත දැක්වෙන ඡේදය කියවා ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් ම සොයා ලියන්න.

යාළුවො පුදුම වෙලා කරත්තෙ දිහා බලාගෙන ඉන්නකොට, ළඟ තිබුණ පඳුරකින් හාවෙක් එළියට පැන්නා. එයත් කරත්තෙ දිහා බලලා හිනා වෙනවා. හාවාගේ නම පිනුම් හාමි.

"මේ කරත්තේ ඔයාගෙ ද?" කියලා යාළුවො හතර දෙනා පිනුම් හාමිගෙන් ඇහුවා.

ඉහත ඡේදය ඇසුරින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) පුදුමයෙන් කරත්තය දිහා බලාගෙන සිටියේ කවු ද?

..........................................................................................................

2) ළඟ තිබුණ පඳුරකින් එළියට පැන්නේ කවුරුන් ද?

..........................................................................................................

3) හාවාගේ නම කුමක් ද?

..........................................................................................................

4) යාළුවො හතර දෙනා පිනුම් හාමිගෙන් ඇසුවේ කුමක් ද?

..........................................................................................................

5) මූර්ධජ සහ සඤ්ඤක අකුරක් එක ළඟ යෙදෙන වචනය කුමක් ද?

..........................................................................................................

6) ඡේදයේ සඳහන් "ඔ" ශබ්දයට අදාළ පිල්ලම් යෙදුණු වචනයක් සොයා ලියන්න

..........................................................................................................

7) ඇතුළට යන වචනයට විරුද්ධාර්ථය යෙදෙන වචනය ඡේදයෙන් සොයා ලියන්න

..........................................................................................................

8) එක ළඟ පාපිලි 2 ක් යෙදී ඇති වචනය සොයා ලියන්න

..........................................................................................................

9) පහත සඳහන් වචන ගළපා අර්ථවත් වාක්‍ය සාදන්න.

1) මම / දළඹු / ටිකක් / දැක්කා / යාළුවෝ

..........................................................................................................

2) වේ / පොත් / මිනිසා / සම්පූර්ණ / කියවීමෙන්

..........................................................................................................

# පිළිතුරු



**Answer**

# යුගල පද

- යුගල පද යනු - වචන දෙකකි.
- යුගල පදවල විශේෂත්වය වන්නේ එකවර වචන දෙකක් ම යෙදීමයි.
- මෙම යුගල පද යෙදීම නිසා කතා කරන දේ ලියන දේ අලංකාර වෙයි.
- යුගල පද ලිවීමේ දී පද වෙන් කර ලිවිය යුතුයි.
- හොඳ දරුවෝ ඡේදයේ පහත සඳහන් යුගල පද වර්ණ ගන්වන්න.

## හොඳ දරුවෝ

ඈත කඳුකර ප්‍රදේශයක තිබුණු සුන්දර ගමක පුංචි පවුලක් ජීවත්වුණා. අම්මා, තාත්තා, දුව සහ පුතා මේ පවුලේ සාමාජිකයෝ. පුතාගේ නම මලිත්. දුව මලිති. මලිත් සහ මලිති ඉතා ම හොඳ ගති පැවතුම් ඇති ළමයි දෙදෙනෙක්. අම්මා සමග ගමන් බිමන් යන්න මේ දෙන්නා හරි ම ආසයි. ඒ යන අතරමග දී හමුවන අහල පහල අය සමග මොවුන් සුහද ව කතා බහ කරනවා. ගමේ හැම දෙනා ම මේ දරුවන් දෙන්නාට හරි ම ආදරෙයි. අපේ සිරිත් විරිත්වලට ගරු කරන, දෙමවුපියන්ට කීකරු වී හැදෙන ළමයි දෙදෙනෙක් කියලා ගමේ කවුරුත් කතා බහ කළා. මේ දරුවන්ගේ හොඳ ගතිගුණවලට පැහැදුණු ගමේ සමහර අය ඔවුන්ට තෑගි බෝග පවා රැගෙන ගෙදරට ආවා. එසේ පැමිණෙන අයට කෑම බීමවලින් සංග්‍රහ කරන්න මේ ගෙදර අය අමතක කළේ නැහැ. මේ දරුවෝ දෙන්නා ඉගෙනීමටත් දක්ෂ යි. පාසලේ බාහිර වැඩ කටයුතුවල දී ද මොවුන් කැපී පෙනෙන අයුරින් කටයුතු කරනවා.

- වරහනින් තෝරා සුදුසු පද යොදා හිස්තැන් පුරවන්න. (බිමන්, බෝග, බීම, පහල, විරිත්)

ගමන් - ......බිමන්......  අහල - ......පහල......

සිරිත් - ......විරිත්......  තෑගි - ......බෝග......

කෑම - ......බීම......

- 'හොඳ දරුවෝ' කතන්දරයේ යුගල පද යෙදී ඇති නිසා එම වාක්‍ය අලංකාර වී ඇති බව උදාහරණයකින් ගෙන දක්වන්න.

උදා : 1. අම්මා සමග <u>ගමන්</u> යන්න මේ දෙන්නා හරි ම ආසයි.

2. අම්මා සමග <u>ගමන් බිමන්</u> යන්න මේ දෙන්නා හරි ම ආසයි.

ඔවුන්ට <u>තෑගි</u> පවා රැගෙන ගෙදරට ආවා.

ඔවුන්ට <u>තෑගි බෝග</u> පවා රැගෙන ගෙදරට ආවා.

- උගත් යුගල පද යොදා වාක්‍ය තනන්න.

අපි අලුත් අවුරුද්දට <u>ගමන් බිමන්</u> ගියෙමු.

අපේ ගෙදර <u>අහල පහල</u> අය හරි හොඳයි.

අපි අවුරුදු <u>සිරිත් විරිත්</u> වලට ගරු කරමු.

මගේ උපන් දිනයට <u>තෑගි බෝග</u> රැසක් ලැබුණි.

අම්මා මට රසවත් <u>කෑම බීම</u> හදා දුන්නා ය.

....................................................

<u>**ප්‍රස්තාව පිරුළු**</u>

- කියවීම් පොතේ ඇතුළත් රජතුමාගේ ඔටුන්න පාඩම ආදර්ශ කියවීමක යෙදෙන්න. උගත් ප්‍රස්තාව පිරුළු වල හිස්තැන් සම්පූර්ණ කරන්න.

ගෙදර ගිය යහළුවන් සවස ආයෙත් පාසලට ආවා. ඒ, වාර අවසානයේ විවිධ ප්‍රසංගයට නාට්‍ය පුහුණු වෙන්න.

''විවිධ ප්‍රසංගයෙන් පස්සේ නිවාඩු කාලේ.

''අපේ තාත්තා කිවුවා මේ ගමන කැලෑවක ඇවිදින්න යමු යි කියලා. මම කවදාවත් කැළෑවකට ගිහින් නැහැ. මම හරි ආසාවෙන් බලන් ඉන්නේ ඒ දවස එනකම්.'' පියුම් කිවුවා.

''අපි නම් ගමේ යනවා.'' රුවින්දි කිවුවා.

''ගමේ යන එකත් හොඳයි. ඒත් ඉතිං රටේතොටේත් ටිකක් ඇවිදින්න ඕනෑ. නැත්නම් ඉතින් **ළිඳේ ඉන්න ගෙම්බා වගේ** තමයි. ගුරුතුමා ද කතාවට එකතු වුණා.

රජතුමාට රඟපාන පසිඳු තව ම ඇවිත් නැහැ. යහළුවන් කසු කුසු ගෑවා.

''ළමයි දැන් අපි නාට්‍යය පුහුණු වෙන්න පටන් ගනිමු.'' ගුරුතුමා කිවුවා.

''එතකොට රජතුමා . . .'' පියුම් ඇසුවා.

''පසිඳු එනකම් මම රජ වෙන්නම්.'' මනුක එක අතක් ඉණට ගසා අනෙක් අත ඉහළට ඔසවා තාල තබා වටයක් කැරකුණා.

යහළුවන් සිනාසුණා.

''ඇයි හිනාවෙන්නේ මට රජවෙන්න බැරි ද ?'' පසිඳු ආවා ම මම රජකම භාර දෙනවා. මනුක කිවුවේ දෑත් දිගු කොට හිස නමමින්. යහළුවන් හොඳට ම සිනාසුණා.

''සිතුම් . . . එන්න ඉස්සරහට. ඔයාගේ කොටස රඟපාන්න.'' ගුරුතුමා කිවුවා.

''පස්වාන් දහසකට බුදු වෙන්න දේවයන් වහන්ස, මා ඔබ වහන්සේ ඉදිරියේ මුසා බස් දොඩනවා නොවෙයි. ඒ මිනිහා **මඩේ හිටවපු ඉන්න වගෙයි**.

අඳේට කුඹුර දෙන්නම් කිවුවා මුලින් ම. ඒත් දැන් කෙළින් වචනයක් දෙන්නේ නැහැ.

සලකා බලන්නම් . . . සලකා බලන්නම් . . . හැම දා ම සලකා බලන්නම්.''

''අන්න හරි, අද සිතුම් හොඳට රඟපෑවා. ඒ වගේ ම එදාටත් රඟපාන්න ඕනෑ. ගුරුතුමා සිතුම්ගේ හිස අත ගෑවා.

ඔය එන්නේ පසිඳුයි තරිඳුයි හරියට **ඉඳිකටුව යි නූලයි වගේ.** සිතුම් කිවුවේ පසිඳුයි තරිඳුයි නැටුම් කාමරයට ඇතුළු වෙන කොට ම යි.

''පසිඳු කොතැන ද තරිඳුත් එතැන. තරිඳු කොතැන ද පසිඳුත් එතැන. නාට්‍යයට නැති වුණත් තරිඳු ආවේ පසිඳු ඉන්න නිසා.'' සිතුම් කියාගෙන කියාගෙන ගියා.

''වෙලාවට වැඩ කරන්න පුරුදු වෙන්න ඕනෑ.'' ගුරුතුමා පසිඳුගේ පිටට තට්ටුවක් දැම්මා.

''නෑ සර් . . . තරිඳුගේ මාමාගේ පුතා ළඟ ඔටුන්නක් තියෙනවා කිවුවා. අපි ඒක බලන්න ගියා.''

''ඉතින් මෙච්චර පරක්කු වුණේ ඇයි ?''

''තරිඳු මාව මාමාලාගේ ගෙදරට එක්ක ගියේ **පරංගියා කෝට්ටේ ගියා වගේ** පාරකින්. මේ පාරෙන් ලෙහෙසියි කියකියා මාව ලොකු වටයක් එක්ක ගියා. එනකොට ආවේ කෙටි පාරකින්.''

''කෝ ඉතිං ඔච්චර දුර ගිහින් ගෙනා ඔටුන්න ?'' මනුක ඇහුවේ ඔටුන්නක් පෙනෙන්න නොතිබුණු නිසා.

''අම්මො '' . . . මෙයාගේ මල්ලිගෙන් ඒ ඔටුන්න ඉල්ල ගන්න එක හරි අමාරුයි. ඒක **ඉබ්බන්ගෙන් පිහාටු ඉල්ලනවා වගේ** වැඩක්. හැබැයි තරිඳුගේ මාමා මට ඔටුන්නක් හදලා දෙන්න පොරොන්දු වුණා.'' පසිඳු කිවුවා.

''හරි. දැන් ඔටුන්නත් හරි. රජ්ජුරුවොත් හරි. අපි නාට්‍යය පුහුණු වෙමු.''

''මෙන්න, රජතුමනි රජකම භාර ගන්න'' කියමින් මනුක පසිඳු ඉදිරියේ දණ නමා දෑත් දිගු කළා. යාළුවන් ඔක්කෝම එක හඬින් සිනාසුණා. නාට්‍ය පුහුණු වීමට පටන් ගත්තා.

01. පරංගියා ......කෝට්ටේ...... ගියා වගේ.

02. ඉබ්බාගෙන් ........පිහාටු.......... ඉල්ලනවා වගේ.

03. ඉදිකටුවයි ........නූලයි........... වගේ.

04. ළිඳේ ඉන්න ......ගෙම්බා......... වගේ.

05. මඬේ හිටවපු ........ඉන්න........... වගේ.

- සුදුසු ප්‍රස්තාව පිරුළ තෝරා යා කරන්න.

| | |
|---|---|
| ළිඳේ ඉන්න ගෙම්බා වගේ | කිට්ටු පාරක් තිබිය දී දුර පාරකින් යෑම |
| ඉදිකටුවයි නූලයි වගේ | එක තීරණයක නොසිටීම |
| මඬේ හිටවපු ඉන්න වගේ | කෙනෙකුගෙන් කෙසේ වත් ලබාගත නොහැකි දෙයක් ලබා ගැනීමට උත්සාහ දැරීම |
| ඉබ්බාගෙන් පිහාටු ඉල්ලනව වගේ | සැමවිටම තමන් සමග තවත් අයෙක් එකට සිටීම |
| පරංගියා කෝට්ටේ ගියා වගේ | තමා අවට සමාජය පිළිබඳ අවබෝධයක් නොමැති ව සිටීම |

**පුනරීක්ෂණ**

**හා හා හරි හාවා - කැලේ මැදින් ආවා**
**සිටගෙන ගඟ ගාවා - වට පිට ඇහැලෑවා**
**කොළ දෙකටක් කෑවා - පැන් උගුරක් බීවා**
**තොලකට ලෙව කෑවා - ඉතින් ඇතැයි කීවා**

(කුමාරතුංග මුනිදාස සූරීන්)



(1) හාවා ආවේ කොහේ සිටද? ....කැලේ මැදින්....................

(2) කවියේ සඳහන් වන අයුරින් හාවා විසින් කරනු ලබන කාර්යයන් දෙකක් ලියන්න.

....කොළ දෙකටක් කෑවා.......................

....පැන් උගුරක් බීවා.......................

(3) කවි පෙළෙහි සඳහන් පහත සඳහන් දේ සොයා ලියන්න.

- සමානාර්ථ පද

1. වනයේ - කැලේ
2. නදිය - ගඟ
3. ජලය - පැන්

යුගල පදයක් - වට පිට

ක්‍රියා පදයක් - කෑවා / බීවා

(4) පහත දැක්වෙන ඡේදය කියවා ප්‍රශ්නවලට පිළිතුරු ඡේදයෙන් ම සොයා ලියන්න.

යාළුවො පුදුම වෙලා කරත්තෙ දිහා බලාගෙන ඉන්නකොට, ළඟ තිබුණ පඳුරකින් හාවෙක් එළියට පැන්නා. එයත් කරත්තෙ දිහා බලලා හිනා වෙනවා. හාවාගේ නම පිනුම් හාමි.

"මේ කරත්තේ ඔයාගෙ ද?" කියලා යාළුවො හතර දෙනා පිනුම් හාමිගෙන් ඇහුවා.

ඉහත ඡේදය ඇසුරින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) පුදුමයෙන් කරත්තය දිහා බලාගෙන සිටියේ කවු ද?

යාළුවො හතර දෙනා

2) ළඟ තිබුණ පඳුරකින් එළියට පැන්නේ කවුරුන් ද?

හාවෙක්

3) හාවාගේ නම කුමක් ද?

පිනුම් හාමි

4) යාළුවො හතර දෙනා පිනුම් හාමිගෙන් ඇසුවේ කුමක් ද?

"මේ කරත්තේ ඔයාගෙ ද?" කියලා

5) මූර්ධජ සහ සඤ්ඤක අකුරක් එක ළඟ යෙදෙන වචනය කුමක් ද?

ළඟ

6) ඡේදයේ සඳහන් "ඔ" ශබ්දයට අදාළ පිල්ලම් යෙදුණු වචනයක් සොයා ලියන්න

යාළුවො

7) ඇතුළට යන වචනයට විරුද්ධාර්ථය යෙදෙන වචනය ඡේදයෙන් සොයා ලියන්න

එළියට

8) එක ළඟ පාපිලි 2 ක් යෙදී ඇති වචනය සොයා ලියන්න

පුදුම

9) පහත සඳහන් වචන ගළපා අර්ථවත් වාක්‍ය සාදන්න.

1) මම / දළඹු / ටිකක් / දැක්කා / යාළුවෝ

මම දළඹු යාළුවෝ ටිකක් දැක්කා.

2) වේ / පොත් / මිනිසා / සම්පූර්ණ / කියවීමෙන්

පොත් කියවීමෙන් මිනිසා සම්පූර්ණ වේ.

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප **3in1 Youtube** නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තුතියි !

# හසිත හෙට්ටිආරච්චි

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



**3 in 1 youtube** නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ